**ශීර්ෂය - 101 - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

**-----------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

-------------

### 1.1 මතය

-----------

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ඔක්තෝබර් 11 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝබර් 11 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

-----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**----------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ 3.8 (අ) ඡේදයේ නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වාර්තාවේ කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**--------------------**

**2.1 වියදම් කළමනාකරණය**

**------------------------**

**(අ) ප්‍රතිපාදන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.1,500,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිකර තිබුණු අතර පුනරාවර්තන වැය විෂයයන් 07 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක් සඳහා සලසා ගෙන තිබුණු රු.115,970,000 ක ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 86 දක්වා වූ පරාසයකට අයත් රු.46,913,050 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | **ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි කිරීම -**<br>සිනමා ශාලාවේ හා කාර්යාලීය අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදනවලින් ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ නිසා එම කාර්යයන් නොකරන ලදි. එමෙන්ම ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය මඟින් ශ්‍රී දළදා මාළිගාවේ සිදු කරන ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන වෙන්ව ඇති අතර අදාල වියදම් එම කාර්යාලය මඟින් දරනු ලබයි. අමාත්‍යාංශය මඟින් 10-2205(14) වැය විෂයය යටතේ තීරු බදු ගෙවනු ලබයි. එබැවින් සම්පූර්ණ ප්‍රතිපාදන ඉතිරි විය.<br>**සියයට 16 සිට 86 දක්වා ප්‍රතිපාදන ඉතිරි වීම -**<br>ඇස්තමේන්තු පිළියෙල කරනු ලබන අවස්ථාවේ සේවක සංඛ්‍යාව පදනම්ව ඇස්තමේන්තු සකස් කළද පසුකාලීනව නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම්,විශ්‍රාම ගැනීම් සහ රාජ්‍ය අමාත්‍යාංශය වෙත අනුයුක්ත කිරීම, වියදම් කළමනාකරණ චක්‍රලේඛයට අනුගත වීම සහ කොවිඩ් - 19 වෛරසය ව්‍යාප්ත වීම යනාදීය හේතුවෙන් වෙන් කර ගන්නා ලද ප්‍රතිපාදන ඉතිරි විය. | තාත්වික ලෙස වියදම් ඇස්තමේන්තු සකස් කර ප්‍රතිපාදන සලසා ගත යුතු බව. |

(ආ) මු.රෙ. 66 යටතේ මාරුකරන ලද ප්‍රතිපාදන ඉතිරිවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් මු.රෙ 66 යටතේ, පුනරාවර්ථන වැය විෂයයකට රු.700,000 ක් සහ ප්‍රාග්ධන වැය විෂයයකට රු.5,820,000 ක් වශයෙන් ප්‍රතිපාදන මාරු කර තිබුණද මාරු කරන ලද මුළු ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. | අතිකාල සහ නිවාඩු දින වැටුප් සඳහා ඇස්තමේන්තු කරන ලද ප්‍රතිපාදන නොලැබීම නිසා දෙසැම්බර් මාසයේ අපේක්ෂිත අතිකාල ගෙවීම් වෙනුවෙන් මුදල් මාරු කිරීම සිදු කළද කොවිඩ් - 19 නිසා අපේක්ෂිත වියදම් සිදු නොවීමෙන් ප්‍රතිපාදන ඉතිරි විය.<br>මු.රෙ.66 යටතේ සලසා ගන්නා ලද රු.826,000 ක ප්‍රතිපාදනයෙන් රු.421,500 ක් පමණක් ඉතිරිව ඇත. රු.158,000 ක් බැරකම් සඳහා වෙන් කර ඇත. බැදීම් ශේෂය රු. 262,250 ක් ලේඛනවල ඇතුළත් කර ඇත. | ඇස්තමේන්තු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව තහවුරු කර ගැනීමෙන් පසු ප්‍රතිපාදන මාරු කිරීම් සඳහා කටයුතු කළ යුතු බව. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

--------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් ටවර්හෝල් රඟහල පදනම වෙත ගෙවිය යුතු 2014 වර්ෂයට පෙර කාලයට අයත් රු.20,735 ක් එම පදනමේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස දක්වා නොතිබුණි. | අදාල තොරතුරු හෝ ඉන්වොයිස්පත් අමාත්‍යාංශය වෙත යොමු කර නැති අතර බැරකම් ලේඛනයේ ද සටහන් වී නැත. එබැවින් ඒ සම්බන්ධයෙන් ටවර් හෝල් රඟහල පදනම වෙතින් විමසීමක් සිදු කර ඇත. | බැරකම් නිවැරදිව වාර්තා කළ යුතු බව. |

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් සිදු කළ යුතු සහතික වීම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වශයෙන් මෙම අමාත්‍යාංශය ක්‍රියාත්මක වන බැවින් බුද්ධශාසන අංශය තුළ ස්ථාපිත ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ ක්‍රියාත්මක අභ්‍යන්තර විගණන අංශය මඟින් සංස්කෘතික කටයුතු අංශයේ අභ්‍යන්තර විගණන කටයුතු අධීක්ෂණය කරනු ලබයි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 සහ 40 වන වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 2.4 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශය යටතේ වූ කොන්ත්‍රාත් සඳහා වූ මුළු රැඳවුම් මුදල් ශේෂය රු.99,596,333 ක් වූ අතර ඒ තුළ වූ බුද්ධශාසන අංශයට අදාළ රැඳවුම් මුදල් ශේෂය රු.57,343,077 ක් විය. ඉන් වර්ෂ 02 ඉක්මවූ රු.21,711,494 ක් වූ තැන්පතු 08 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව අවස්ථාවෝචිත පරිදි අදාල ගිණුමට හෝ රජයේ ආදායමට හෝ බැර කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රු.605,379.75ක තැන්පතු සම්බන්ධයෙන් ඉල්ලීම් ඉදිරිපත් නොවීම නිසා මු.රෙ.571 අනුව කටයුතු කර ඇත. රු.22,058,338 ක තැන්පතු විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාල වේ. එම ව්‍යාපෘතිය අමාත්‍යාංශය වෙත භාර ගැනීමට අමාත්‍යාංශය සතුව තාක්ෂණික දැනුමක් ඇති බාහිර පාර්ශවයක අධීක්ෂණය යටතේ සිදු කිරීම අවශ්‍ය වේ. 2020 දෙසැම්බර් මාසයේදී ඉංජිනේරු නිලධාරියෙකු පැමිණීමත් සමඟ ව්‍යාපෘතිය භාර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්කෘතික අංශයේ විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 05 කට වැඩි කාලයක සිට පවතින රු.127,522 ක ණය ශේෂය, මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.101,300 ක් වූ ණය ශේෂය හා බුද්ධශාසන අංශයේ විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ වර්ෂ 02ට වැඩි කාලයක සිට පැවත එන රු.167,055 ක ණය ශේෂය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.5, 4.5 හා 4.6 උප වගන්ති ප්‍රකාරව අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රු.128,732.40 ක මුදල ගෙවීමට එකඟතාවය පළ කර ඇති අතර මුදල අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.<br>රු. 35,810 ක ආපදා ණය ශේෂය විශ්‍රාම පාරිතෝෂික ප්‍රධාන පත්‍රයේ සඳහන් පරිදි චෙක්පතක් මඟින් අමාත්‍යාංශය වෙත එවීමට කටයුතු කරන ලෙස දන්වා ඇතත් මෙතෙක් එවා නොමැති බැවින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යැවීමට කටයුතු කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ආ) | සංස්කෘතික අංශයේ වැඩ තහනම් කර ඇති නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.623,090 ක් වූ ණය ශේෂය හා බුද්ධශාසන අංශයේ වැඩ තහනමකට ලක් වූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු වර්ෂ 04 ට වැඩි කාලයක සිට පැවත එන රු.32,155 ක ණය ශේෂය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 4.2.3 උප වගන්තිය සහ 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PED/RED/2015/08 පොදු (i) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 4.3(ඉ) ඡේදය ප්‍රකාරව අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | අදාල ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | ආයතන සංග්‍රහය සහ චක්‍ර ලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------

### 3.1 සැලසුම් කිරීම

---------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව සංස්කෘතික අංශය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ව්‍යාපෘතියට අදාලව අපේක්ෂිත නිමවුම් අගයන් ඉදිරිපත් කර නොතිබුණි. මේ හේතුවෙන් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ හා ප්‍රගති වාර්තාවේ අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් ලෙස ඉදිරිපත් කර තිබූ භෞතික කාර්යසාධනය විගණනයට තහවුරු කර ගත නොහැකි විය. | 2020 වර්ෂයේදී වාර්ෂික ප්‍රතිපාදන වෙන්වීම වාර්ෂික අයවැයක් මඟින් සිදු නොවී අතුරු සම්මත ගිණුම් 04 ක් හරහා අවස්ථා 04 කදී සිදු විය. ඒ අනුව, 2020 වසර සඳහා නිශ්චිතව ප්‍රතිපාදන හඳුනා ගත නොහැකි තත්ත්වයක, අපේක්ෂිත නිමවුම් අගයන් දැක්වීම අසීරු හෙයින් 2020 ක්‍රියාකාරී සැලැස්මට නිමවුම් අගයන් දක්වා නොමැති බව සඳහන් කරමි.<br>2021 ක්‍රියාකාරී සැලැස්ම අංක 02/2020 චක්‍රලේඛය ප්‍රකාරව සකස් කර ක්‍රියාත්මක කරමින් පවතී. එසේම අමාත්‍යාංශයට අයත් සියළුම අංශ, ආයතන හා දෙපාර්තමේන්තුවල ප්‍රගතිය මා විසින් පරීක්ෂා කරන ලදි. ඒ අනුව 2021 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාල අංශ වෙත පැවරී ඇති වගකීම් ඉටු කර අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට මා විසින් උපදෙස් ලබා දීමට තවදුරටත් පියවර ගෙන ඇත. | ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ව්‍යාපෘතියට අදාලව අපේක්ෂිත නිමවුම් අගයන් ඉදිරිපත් කළ යුතු බව. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරිම

------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයට අදාලව සංස්කෘතික අංශයේ පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් රාජ්‍ය සේවා නිර්මාණ තරඟාවලිය ආශ්‍රිත ක්‍රියාකාරකම් හා යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම යන ව්‍යාපෘති සඳහා | රාජ්‍ය සේවා නිර්මාණ තරඟාවලිය හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් - 2020 වැඩසටහන සඳහා මූලික කාර්යයන් ආරම්භ කළ නමුත් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් | අදාල ක්‍රියාකාරකම්, නියමිත කාලසීමාව තුළ සැලසුම් කරන ලද ආකාරයට සම්පූර්ණ කළ යුතු බව. |

| | | |
|---|---|---|
| පිළිවෙලින් රු.3,500,000 ක් හා රු.28,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණද අදාල කාර්යයන් වර්ෂය තුළදී ඉටුකර නොතිබුණි. රාජ්‍ය සේවා නිර්මාණ තරඟාවලිය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය සියයට 37 ක් ලෙස කාර්යසාධන වාර්තාවේ දක්වා තිබූ අතර යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වෙන්කර තිබූ රු.28,000,000 න් රු.27,960,000 ක් ග්‍රාමීය නිවාස ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය වෙත ලබාදීම නිසා මූල්‍ය ප්‍රගතිය සියයට 100 ක් හා භෞතික ප්‍රගතිය සියයට 0 ක් වී තිබුණි. | මුළුමනින්ම නිම කිරීමට නොහැකි විය. 2020 නොවැම්බර් 30 දිනට 101-2-5-36-2509 වැය විෂයය යටතේ යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා වෙන් කරන ලද (ඉන්දීය ආධාර) ප්‍රතිපාදන පහත ආයතන වෙත පවරා ඇත.<br>• ග්‍රාමීය, නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - රු.16,999,936.96<br>• යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රු. 3,000,000<br>• පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය - රු. 7,960,357.64<br>යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය ඉදි කිරීමට අදාලව ඉන්දීය ආධාර යටතේ අතුරු සම්මත ගිණුමක් මඟින් රු. මිලියන 20 ක මුදලක් ලබා ගෙන එම මුදල යාපනය සංස්කෘතික මධ්‍යස්ථානයේ විදුලි බිල් පියවීම සඳහා නිවාස, ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා ඇත. | |

**3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනිම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්කෘතික අංශයට අදාලව වර්ෂය තුළදී අපේක්ෂිත කාර්යසාධනය ලබා නොතිබූ රු.59,430,000 ක් වූ ප්‍රාග්ධන ව්‍යාපෘති 08 ක් හා රු.19,120,000 ක් වූ පුනරාවර්තන ව්‍යාපෘති 06 ක් වූ අතර එම ව්‍යාපෘතිවලින් පිළිවෙලින් රු.31,540,961 ක් හා රු.13,477,897 ක් වැය කර නොතිබුණු එම අදාල ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 0 සිට සියයට 79 ක් අතර පරාසයක විය. | අභ්‍යන්තර චක්‍රලේඛ අංක 01/2020 අනුව, වියදම් කළමනාකරණය හා පාලනය තුළින් රාජ්‍ය මුදල් ඉතිරි කර ගනිමින් දරනු ලබන වියදම්වල උපරිම ඵලදායීකරණයක් ළඟා කර ගැනීමත් අරමුණු කර ගනිමින් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් අවම කර ගැනීමට කටයුතු කරන ලදි. | අදාල ව්‍යාපෘති සම්බන්ධයෙන් අපේක්ෂිත කාර්යසාධන මට්ටම ලබා ගත යුතු බව. |

## 3.4 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රු.මි.145.7 ක මුළු ඇස්තමේන්තුවක් මත 2016 සැප්තැම්බර් 16 දින වැඩ ආරම්භ කර 2020 සැප්තැම්බර් 30 දින වැඩ නිම කළ යුතුව තිබූ බුද්ධශාසන අංශය මඟින් ක්‍රියාත්මක ශ්‍රී දළදා මාළිගාවට අනුයුක්ත පල්ලෙකැලේ ප්‍රාසාංගික පුහුණු ආයතනයේ ඉදිකිරීම් කටයුතු විගණන දිනය වූ 2021 අගෝස්තු 11 දින වන විටත් අවසන් කර නොතිබුණි. වැඩ නිම කළ යුතු කාලය ඉක්මවා අවුරුද්දකට ආසන්න කාලයක් ගත වුවද එහි මූල්‍ය ප්‍රගතිය සියයට 41 ක් සහ භෞතික ප්‍රගතිය සියයට 56 ක් විය. | ව්‍යාපෘතිය නිම කිරීමට නිශ්චිත දිනයක් සහ අපේක්ෂිත වැඩ සැලැස්මක් ඉදිරිපත් කරන ලෙස කොන්ත්‍රාත්කරුට දන්වා ඇත. ව්‍යාපෘතියේ අවබෝධතා ගිවිසුම අනුව ගිවිසුම් ගත වීම ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය මඟින් සිදු කර ඇති බැවින් කොන්ත්‍රාත්කරුට සෘජු මැදිහත් වීමක් සිදු කිරීමට මෙම අමාත්‍යාංශයට නොහැකි අතර ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවලදී මේ පිළිබඳව සාකච්ඡා කර ඇත.<br>කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ව්‍යාපෘතියේ කටයුතු තවදුරටත් ප්‍රමාද වුවද 2021 අගෝස්තු 17 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය සියයට 77ක් පමණ මට්ටමකට ළඟාවී ඇති ඇත. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කළ යුතු බව. |
| (ආ) සංස්කෘතික අංශය විසින් ක්‍රියාත්මක කර තිබූ දේශීය දැනුම හා සංස්කෘතික අගයන් පිළිබඳ පර්යේෂණ ක්‍රියාකාරකම් ව්‍යාපෘතිය මඟින් පුත්තලම දිස්ත්‍රික්කයේ ජනකලා සම්බන්ධ පර්යේෂණාත්මක ග්‍රන්ථයක් මුද්‍රණය කිරීමට සැලසුම් කර අදාල ග්‍රන්ථ පිටපත් 1000 ක් මුද්‍රණය කර තිබුණි. එහෙත් 2021 මැයි 31 දින වන විටත් ඉන් පිටපත් 17 ක් පමණක් අමාත්‍යාංශයෙහි විවිධ අංශ වෙත ලබාදී ඉතිරි පිටපත් අපේක්ෂිත කාර්ය සඳහා යොදා නොගෙන ගබඩාවෙහි රඳවාගෙන තිබුණි. | පුත්තලම දිස්ත්‍රික්කයේ ජනප්‍රවාද සම්බන්ධ පර්යේෂණ ග්‍රන්ථය, පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ජනගත කිරීමට නොහැකි වූ අතර ඉදිරියේදී එම කටයුතු සිදු කරමි. | අදාල ව්‍යාපෘති නියමිත කාලසීමාව තුළ සැලසුම් කළ පරිදි අවසන් කළ යුතු බව. |

## 3.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | රු.21,383,325 ක පිරිවැයක් ඇස්තමේන්තු කර තිබූ උහණ සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීමේ කාර්යය සඳහා 2015 වර්ෂයේ සිට 2018 දක්වා වරින්වර රු.21,850,000 ක ප්‍රතිපාදන අම්පාර දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී තිබුණි. ඉදිකිරීම් ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කිරීමක්ද අමාත්‍යාංශය විසින් සිදු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නිම කර නොතිබුණි. | 2012 වසරේදී ආරම්භ කරන ලද මෙම ඉදිකිරීම් කටයුතු සඳහා වූ මුල් ඇස්තමේන්තුව රු.21,383,352 ක් වුවත් ඇස්තමේන්තුවේ ඇති අඩුපාඩු නිසා 2015 දී රු.23,949,354 ක සංශෝධිත ඇස්තමේන්තුවක් අම්පාර දිස්ත්‍රික් ලේකම් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා රු. මිලියන 5 ක ප්‍රතිපාදන 2015.10.13 දින අම්පාර දිස්ත්‍රික් ලේකම් වෙත යවන ලදි.<br>දිස්ත්‍රික් ලේකම් විසින් ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් කිරීමෙන් පසු වරින්වර අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන නිදහස් කර තිබේ. එහි ප්‍රගතිය මුදල් අමාත්‍යාංශයේ මාසික ප්‍රගති වාර්තාවෙන්ද අමාත්‍යාංශය මඟින්ද අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නිරීක්ෂණ මගින් ද අධීක්ෂණය කර තිබේ. මේ වන විට දෙසතියකට වරක් ඉදිකිරීම් ව්‍යාපෘති සම්බන්ධ ප්‍රගති සමාලෝචනය අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබයි. | අදාල ව්‍යාපෘති නියමිත කාලසීමාව තුළ සැලසුම් කළ පරිදි අවසන් කළ යුතු බව. |
| (ආ) | බුද්ධශාසන අංශයට අදාලව 2005 වර්ෂයේ ආරම්භ කර තිබූ විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාවේ ඉදිකිරීම් කටයුතු රු.මිලියන 1,204.33 ක පිරිවැයක් දරා අදියර 05 ක් දක්වා පමණක් 2019 වර්ෂයේදී අවසන් කර තිබුණු අතර 06 වන අදියරේ ඉදිකිරීම් කටයුතු මෙතෙක් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතියේ v වන අදියරේ ඉදිකිරීම් 2019 වර්ෂයේදී නිම කරන ලද අතර vi වන අදියරේ ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළද එය අනුමත වී නොමැත.<br>vi වන අදියරේ ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලෙස මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඉල්ලීමක් කර ඇතත් අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඒ සඳහා ප්‍රතිපත්තිමය | අදාල ඉදිකිරීම්, සැලසුම් කළ පරිදි සම්පූර්ණ කර භාවිතයට ගත යුතු බව. |

තීරණයක් සුදුසු බව දන්වා ඇත.

වර්තමාන ජනාධිපතිතුමා විසින් ඉතිරි ඉදිකිරීම් කටයුතු යුධ හමුදාව මගින් සිදු කරන ලෙස ලබා දෙන ලද උපදෙස් අනුව ප්‍රතිපාදන ඉල්ලා ඇත. යුධ හමුදාව වෙත ප්‍රතිපාදන ලබා දීම සෘජුවම හෝ මෙම අමාත්‍යාංශය හරහා සිදු වන්නේද යන්න පිළිබඳ උපදෙස් ඉල්ලා ජනාධිපති ලේකම් වෙත ලිපියක් යොමු කර ඇත.

vi වන අදියරේ ඉදිකිරීම් යුධ හමුදාවට පැවරීමට හා ප්‍රතිපාදන වෙන් කර ගැනීමටත් v වන අදියරේ විචලනයන් සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමටත් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලද අතර අදාල ප්‍රතිපාදන මධ්‍යකාලීන වියදම් රාමුව තුළින් සලසා ගැනීමට හා v වන අදියරෙ විචලනයන් සඳහා අදාල ප්‍රසම්පාදන කමිටු නිර්දේශ අනුව ගෙවීම් කිරීමට අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව, මධ්‍යකාලීන සැලැස්ම අනුව vi වන අදියරේ ඉදිකිරීම් වෙනුවෙන් 2021 සඳහා රු.මිලියන 200 ක, 2022 සඳහා රු.මිලියන 52.77ක සහ 2023 සඳහා රු.මිලියන 50 ක ප්‍රතිපාදන සහ v වන අදියරේ විචලනයන් සඳහා රු.මිලියන 48.076 ක ප්‍රතිපාදන ඉල්ලා ඇති අතර v වන අදියරේ විචලනයන් සඳහා රු.මිලියන 48.076 ක ප්‍රතිපාදන 2021 වර්ෂය සඳහා වෙන් වී ඇත.

vi වන අදියරේ අත්‍යාවශ්‍ය වැඩ හඳුනා ගෙන ඇස්තමේන්තුවක් සකස් කර ඉදිරිපත් කරන ලෙස මුදල් අමාත්‍යාංශය විසින් දන්වා ඇත. ඒ අනුව ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම කාර්යාංශය මගින් අත්‍යාවශ්‍ය වැඩ කොටස් හඳුනා ගෙන ඇස්තමේන්තු සකස් කිරිම මේ වන විට සිදු කරමින් පවතී.

## 3.6 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංස්කෘතික අංශයේ 2020 වර්ෂයේ ප්‍රගති වාර්තාවට අනුව ඇස්තමේන්තු වටිනාකම රු.7,930,000 ක් වූ සංස්කෘතික මධ්‍යස්ථාන 15 ක් අලුත්වැඩියා හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට අදාලව මූල්‍ය ප්‍රගතිය සියයට 96 ක් ව තිබියදී භෞතික ප්‍රගතිය සියයට 64 ක් ව පැවතුණි. | අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් ලබා දුන් ඇස්තමේන්තු ප්‍රකාරව මධ්‍යස්ථාන අලුත්වැඩියාව සහ නඩත්තුව සඳහා රු.7,327,000 ක් නිදහස් කර තිබුණි. එහෙත් කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ඇතැම් ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වී තිබේ. ඒ අනුව භෞතික ප්‍රගතිය 64% ක් ව පැවති අතර මේ වන විට ව්‍යාපෘති අවසන් කර භෞතික ප්‍රගතිය 100% ක මට්ටමට පැමිණ තිබේ. | සැලසුම් කළ පරිදි අදාල ව්‍යාපෘතිවල ප්‍රගතිය ලබා ගත යුතු බව. |

## 3.7 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සංස්කෘතික අංශය සඳහා කාර්යසාධන දර්ශක 08 ක් හඳුනාගෙන තිබුණද 2019 ජූලි 25 දිනැති අංක 2/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 04 ඡේදයට අදාලව නිකුත් කරන ලද අතිරේක ප්‍රකාරව එම කාර්යසාධන දර්ශක ප්‍රකාශයට පත්කර නොතිබුණි. | සංස්කෘතික අංශයේ කාර්යසාධන වාර්තාව, අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අදාල මාර්ගෝපදේශ 12.2 ඡේදයේ උපදෙස් පරිදි සකස් කර ඇත. සංස්කෘතික අංශය, 2020 වාර්ෂික කාර්යසාධන වාර්තාවේ පරිච්ඡේද අංක 04 යටතේ කාර්යසාධක දර්ශක 08 ක් දක්වා ඇත.<br>2021 යාවත්කාලීන වන ක්‍රියාකාරී සැලැස්ම සඳහා මෙම ක්‍රියාකාරී දර්ශක ප්‍රකාශයට පත් කර එය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | හඳුනා ගන්නා ලද කාර්යසාධන දර්ශක චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රකාශයට පත් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සංස්කෘතික අංශය සඳහා හඳුනාගෙන තිබූ කාර්යසාධන දර්ශක 08 න් 05 ක අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් ලෙස තථ්‍ය නිමවුමේ සියයට 0 සිට සියයට 32 දක්වා ඉතා අඩු මට්ටමක පැවතුණි. කාර්යසාධන දර්ශක 03 ක අපේක්ෂිත නිමවුම සියයට 25 ක්, 31 ක් හා 26 ක් ලෙස පැවති අතර වාර්ෂික ප්‍රගති වාර්තාවේ තථ්‍ය නිමවුම පිළිවෙලින් සියයට 79 ක් 37 ක් හා 21 ක් ලෙස දක්වා තිබුණි. | 2020 වසර පුරා පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සීමා පැනවීම්, අපේක්ෂිත නිමවුම් පහළ තත්ත්වයට පත්වීමට හේතු විය. | හඳුනා ගන්නා ලද කාර්යසාධක දර්ශක සම්බන්ධයෙන් උපරිම ප්‍රගතියක් ලබා ගත යුතු බව. |
| (ඇ) | සංස්කෘතික අංශය සඳහා වූ අනුකූලතා වාර්තාව යටතේ අනුකූල වන බවට දක්වා තිබූ අවශ්‍යතා 11 ක් අනුකූල නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | අදාළ කරගත යුතු අවශ්‍යතාවයන්ට අදාළව අනුකූලතාවය නිවැරදිව දැක්විය යුතු බව. |
| (ඈ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තා ද විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු විය. එහෙත් ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර තිබූ බෞද්ධ පුනරුද අරමුදල, බුදුපුත් සුරක්ෂා වැඩසටහන, නව ආගමික මධ්‍යස්ථාන සාමණේර ආයතන ලියාපදිංචිය සහ බෞද්ධ උපදේශක සභා රැස්වීම් උපදේශක සභාව විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත සැලසුම් හා අනුශාසනා ආදිය සඳහා අදාල කාර්යසාධන වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මෙහි දක්වා ඇති ව්‍යාපෘති සඳහා අදාල පරිදි කාර්යසාධන වාර්තා ඉදිරිපත් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් යටතට ගැනෙන අන්තර් ජාතික වශයෙන් ථෙරවාදී බුදු දහම ප්‍රචාරය කිරීම සඳහා සැලසුම් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා විවිධ ප්‍රතිලාභ හා පොරොන්දු ලබා දෙමින් වෙනත් ආගම්වලට බඳවා ගැනිම වළක්වාලීම සඳහා වූ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර නොතිබුණු අතර ඒ සම්බන්ධ කාර්යසාධනය ද ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අමාත්‍යාංශයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් හා ඒ සම්බන්ධ කාර්යසාධනය ඉදිරිපත් කළ යුතු බව. |

3.8 **වත්කම් කළමනාකරණය**

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල ගොඩනැගිලි සහ ඉදිකිරීම් යටතේ තක්සේරු වටිනාකම රු.2,893,409,044 ක් ලෙස සඳහන් ගොඩනැගිලි, අමාත්‍යාංශයේ සංස්කෘතික අංශයට අයත් ලෙස දක්වා තිබුණද ඒවා ඉදිකර තිබූ ඉඩම්වල අයිතිය අමාත්‍යාංශයට පවරා ගෙන නොතිබුණි. | මේ වන විට සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටි ඉඩම්වලින් ඉඩම් 70 ක අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගෙන ඇති අතර අනෙකුත් ඉඩම්වල අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | අමාත්‍යාංශයේ සංස්කෘතික අංශය සතු වාහන 12 ක් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත මුදා හැර තිබුණද එම වාහනවල හිමිකම හා අයිතිය පවරාදීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | අදාල වාහන 12 න් 09 ක් තාවකාලිකව නිදහස් කර ඇති අතර වාහන 02 ක් මේ වන විට පවරා දීමට කටයුතු කර ඇත. | වෙනත් අමාත්‍යාංශ වෙත මුදා හැර ඇති වාහනවල අයිතිය හා හිමිකම පවරා දීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) | අපහරණය කළ යුතු බවට හඳුනා ගෙන තිබූ සංස්කෘතික අංශය සතු රු.16,300,000 ක් පිරිවැය වූ වාහන 4 ක් සහ පිරිවැය සඳහන්ව නැති වාහන 11 ක් 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 13.2(ආ) ඡේදය අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණය කළ යුතු වාහන හඳුනා ගැනීමේ මණ්ඩලය විසින් අදාල වාහන හඳුනා ගෙන තක්සේරු කමිටුව වෙත යොමු කර ඇති අතර එම කටයුතු 2021 ඔක්තෝබර් 15 දිනට ප්‍රථම නිරවුල් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කළ යුතු බවට හඳුනාගෙන තිබූ වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතු බව. |

## 3.9 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඇප තැබිය යුතු යැයි හඳුනාගෙන තිබූ සංස්කෘතික අංශයට අදාල නිලධාරීන් 25 දෙනෙකුගෙන් නිලධාරීන් 22 ක් සහ බුද්ධශාසන අංශයේ නිලධාරීන් 35 ක් දෙනෙකු ඇප තබා නොතිබුණි. | මෙම අමාත්‍යාංශයේ ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් සම්බන්ධයෙන් අනොන්‍ය ඇපකාර සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අදාල ලේඛන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. සාමාජිකත්වය ලද වහාම ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. තවද, ඇප තැන්පත් කළ යුතු මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ගිණුම් විවෘත කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතී. | මු.රෙ 880 යටතේ ඇප තැබිය යුතු රජයේ නිලධාරීන්, මුදල් රෙගුලාසි විධිවිධාන අනුගමනය කරමින් ඇප තැබීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතු බව. |

## 3.10 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු.මිලියන 312.49 ක් වැය කර ඉදිකර තිබූ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පවත්වා ගෙන යනු ලබන ගොඩනැඟිල්ලේ වර්ග අඩි 33547 ක විශාල ඉඩකඩ ප්‍රමාණයක් භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. එහෙත් අමාත්‍යාංශය යටතේ පවතින ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව හා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිළිවෙලින් රු.4,200,000 ක හා රු.6,816,000 ක වාර්ෂික කුලි පදනම මත පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වා ගෙන යමින් පැවතුණි. | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිහිටි ගොඩනැඟිල්ල වෙතට අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පිහිටි බෞද්ධ කටයුතු, හින්දු හා ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තු ආදී ආයතන රැගෙන යාමට සැලසුම් කර ඇත.<br><br>ඒ සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ප්‍රතිපාදන අනුමත කර ගෙන ඇති අතර එම ගොඩනැඟිල්ලේ ඉතිරි වැඩ නිම කිරීමට හා අභ්‍යන්තර වෙන් කිරීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. අදාල කටයුතු නිම වූ පසු ඉහත සඳහන් සියලු ආයතන එම ගොඩනැඟිල්ලට ගෙන යාම සිදු වේ. | නිෂ්කාර්යව පවත්නා වත්කම් උපරිම ආකාරයෙන් භාවිතයට ගත යුතු බව. |

## 4 යහපාලනය
-------------

### 4.1 අභ්‍යන්තර විගණනය
--------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මේ අංගයක් ලෙස සංස්කෘතික අංශය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන සැලැස්ම, බුද්ධශාසන අංශය මගින් ඉදිරිපත් කර ඇති විගණන සැලැස්ම තුළ අන්තර්ගත කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්මේ අංගයක් ලෙස සංස්කෘතික අංශය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කල යුතු බව. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා 2018 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින සංස්කෘතික කටයුතු අංශයේ අභ්‍යන්තර විගණක තනතුර පිරවීමට කටයුතු කර නොතිබූ අතර එම අංශය සඳහා අභ්‍යන්තර විගණනයක් ද සිදු කර නොතිබුණි. | මෙම අමාත්‍යාංශය සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 1 වන ශ්‍රේණියේ තනතුරක් අනුමත වී ඇත්තේ ප්‍රධාන ගණකාධිකාරී තනතුර සඳහා පමණි. අභ්‍යන්තර විගණක තනතුර සඳහා අනුමත කර ඇත්තේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 111/11 වන ශ්‍රේණි පමණි. අනුමත ගණකාධිකාරී තනතුරු දෙක පවතින රාජකාරී කටයුතු සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් තවත් ගණකාධිකාරී තනතුරක් අනුමත කර ඇත. ඒ සඳහා නිලධාරියෙක් අනුයුක්ත කළ පසු අභ්‍යන්තර විගණක තනතුර සඳහා අනුයුක්ත කිරීමට අපේක්ෂා කරමි.<br>බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වශයෙන් මෙම අමාත්‍යාංශය ක්‍රියාත්මක වන බැවින් බුද්ධශාසන අංශය තුළ ස්ථාපිත ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ ක්‍රියාත්මක අභ්‍යන්තර විගණන අංශය මගින් සංස්කෘතික කටයුතු අංශයේ අභ්‍යන්තර විගණන කටයුතු අධීක්ෂණය කරනු ලබයි. එසේම අමාත්‍යාංශයේ විගණන සැලැස්ම බුද්ධශාසන අංශය මගින් ඉදිරිපත් කර ඇති විගණන සැලැස්ම තුළ අන්තර්ගතව ඇත. | විධිමත් පරිදි අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතු වීම. |

5. **මානව සම්පත් කළමනාකරණය**

------------------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්කෘතික අංශයේ ප්‍රාථමික මට්ටමේ තනතුරක් වන සංස්කෘතික මධ්‍යස්ථාන මුරකරු අනුමත තනතුරු සංඛ්‍යාව 201 ක් වුවද එම අනුමත සේවක සංඛ්‍යාවට පරිබාහිරව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 යටතේ ස්ථිර කර තිබූ මුරකරුවන් 107 ක් දරන්නාට පමණක් පෞද්ගලික වන සේ පවත්වා ගැනීමට 2020 දෙසැම්බර් 10 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී තිබුණි. මේ හේතුවෙන් අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවූ තත්‍ය කාර්ය මණ්ඩලය 105 ක් විය. | ආදේශක මුරකරුවන් වශයෙන් සේවය කරන ලද ඉහත චක්‍රලේඛයේ විධිවිධාන අනුව සුදුසුකම් ලැබූ 114 දෙනෙකුට ස්ථිර පත්වීම් ප්‍රදානය කර ඇති අතර , එම පත්වීම් ඔවුන්ට පෞද්ගලික වන සේ ලබා දී ඇත. එම පත්වීම්ලාභීන් අතරින් සේවය හැරයාම සහ වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත ඉවත් වීම නිසා දැනට සේවයේ නිරතව ඇත්තේ 107 දෙනෙකු පමණි. ඒ අනුව සේවයේ නියුතු මුළු මධ්‍යස්ථාන මුරකරුවන් සංඛ්‍යාව 308 කි. 194 ක් වූ මධ්‍යස්ථානවලින් ඇතැම් මධ්‍යස්ථාන සඳහා මුරකරුවන් දෙදෙනෙකු බැගින් දිවා රාත්‍රී සේවයේ යොදවා ඇත. | අනුමත පරිදි කාර්ය මණ්ඩලය බඳවා ගත යුතු බව. |
| (ආ) | ස්ථාන මාරුවීමක් නිසා සංස්කෘතික අංශයේ පුරප්පාඩුව පැවති තෘතීය මට්ටමේ තනතුරක් වන පරිපාලන නිලධාරි තනතුර සඳහා 2018 ජූලි 09 සිට කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිලධාරියෙකු ඔහුගේ ඉල්ලීම මත බඳවාගෙන තිබුණි. ඒ අනුව ඉහත නිලධාරියාගේ කොන්ත්‍රාත් පත්වීම හා අවස්ථා 4කදී සිදු කළ සේවය දීර්ඝ කිරීම් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ ආවරණ අනුමැතියට යටත්ව සිදුකර තිබුණි. ඒ අනුව 2009 පෙබරවාරි 20 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති ගැසට් නිවේදනයේ XIII වැනි පරිච්ඡේදයේ 154 වන වගන්තියට හා 2019 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2019 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛයේ 05.XIV වැනි ඡේදයට පටහැනිව මෙම සේවා දීර්ඝ කිරීම් සිදුකර තිබුණි. 2019 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2019 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛයේ 05.XV ඡේදය ප්‍රකාරව | 2018 වර්ෂයේ දී එවකට පැවති අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ විෂය පථය අභ්‍යන්තර හා වයඹ සංවර්ධන කටයුතු අමාත්‍යාංශය ලෙසත් උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ලෙසත් අමාත්‍යාංශ දෙකක් යටතට පත්වීමෙන් අනතුරුව කාර්ය මණ්ඩලය අමාත්‍යාංශ දෙක සඳහා වෙන් කිරීමේදී සංස්කෘතික අංශයේ වැඩි කොටසක් අභ්‍යන්තර හා වයඹ සංවර්ධන කටයුතු අමාත්‍යාංශය වෙත අනුයුක්ත කරන ලදි.<br>එවකට අතිරේක ලේකම් (පාලන) හදිසියේ අභාවප්‍රාප්තවීම හේතුවෙන් එම තනතුරත් පරිපාලන නිලධාරී තනතුරත් සහකාර ලේකම් තනතුරු දෙකත් පුරප්පාඩුව පැවතුණි. පාලන අංශයේ රාජකාරී කටයුතු හා 190 කට | බඳවා ගැනීම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති හා චක්‍රලේඛ ප්‍රකාරව සිදු කළ යුතු බව. |

විශ්‍රාමිකයින් නැවත සේවයේ යෙදවීම එක් වසරක උපරිම වූ කාලයකට පමණක් සීමා කළ යුතු වුවද මෙම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කර ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග 2019 වර්ෂයෙන් පසුවද ගෙන නොතිබූ අතර 2019 අගෝස්තු 10 දින සිට වසර 2 ක් සඳහා සේවා දිගු ලබා දී තිබුණි. කොන්ත්‍රාත් සේවය සඳහා 2020 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු. 1,661,578 ක් වැටුප් හා දීමනා ලෙස නිලධාරියාට ගෙවා තිබුණි.

අධික සංස්කෘතික මධ්‍යස්ථානයන්හි ආයතනික කටයුතු මෙන්ම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු හා ආයතන 12 ක සම්බන්ධීකරණ කටයුතු යන රාජකාරී කටයුතු ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) වෙත පැවරී තිබුණි.

ඒ අනුව එකී රාජකාරි එක් නිලධාරියෙකුට කර ගෙන යාම අපහසු වූ බැවින් තවත් එක් නිලධාරියෙකු හෝ යම් තනතුරකට අනුයුක්ත කර ගැනීම අත්‍යාවශ්‍ය වූ බැවින් පරිපාලන නිලධාරී තනතුර සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු පත් කර ඇත. ඒ සඳහා අනුමැතිය ලැබීමෙන් පසුව වැටුප් ගෙවීම සිදු කරන ලදි.

පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩුව පැවතියද රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් නිලධාරියෙකු අනුයුක්ත නොකිරීම නිසා සහ රාජ්‍ය සේවයේ පළපුරුදු නිලධාරියෙකුගේ සේවය මෙම අත්‍යාවශ්‍ය නිසා නැවතත් එම නිලධාරියා කොන්ත්‍රාත් පදනම මත පත් කර ගැනීමට කටයුතු කළ අතර ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත.